ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
තැ.පෙ. 02,බෙලිහුල්ඔය - 70140, ශ්‍රී ලංකාව
இலங்கை சபரகமுவ பல்கலைக்கழகம்
த.பெ. இல. 02,பெலிகுல்லோயா,- 70140, இலங்கை
SABARAGAMUWA UNIVERSITY OF SRI LANKA
P.O. BOX 02, BELIHULOYA – 70140, SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය :SU/AC/07<br>எனது இல:<br>My No. : | ඔබේ අංකය :<br>உமது இல:<br>Your No. : | දිනය :2020.07.31<br>திகதி:<br>Date: |

## විභාග සඳහා විශ්වවිද්‍යාලය නැවත ආරම්භ කිරීම

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන සිසුන් සඳහා පැවැත්වෙන සාමාසික විභාග සඳහා පහත ආකාරයෙන් විශ්වවිද්‍යාලය විවෘත කිරීමට තීරණයවී ඇත.

| පීඨය | කණ්ඩායම | නේවාසිකාගාර වෙත පැමිණිය යුතු දිනය | සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන | | ඊමේල් ලිපිනයන් |
|---|---|---|---|---|---|
| | | | දිනය | වේලාව | |
| සමාජ විද්‍යා හා භාෂා පීඨය | 2017/2018 | 09.08.2020 | 10.08.2020 | 1.00-2.00 ප. ව.<br>2.00-3.00 ප. ව. | suslasssocial@gmail.com |
| කෘෂි විද්‍යා පීඨය | 2015/2016 | 10.08.2020 | 11.08.2020 | 10.00-11.00 පෙ. ව. | agriletters@gmail.com |
| තාක්ෂණ පීඨය | 2017/2018 | 10.08.2020 | 11.08.2020 | 11.00 පෙ. ව. -12.00 ප. ව. | suslasstech@gmail.com |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 2015/2016 | 10.08.2020 | 11.08.2020 | 1.00-2.00 ප. ව. | assapplied@gmail.com |
| භූ විඥාපන පීඨය | 2015/2016 | 10.08.2020 | 11.08.2020 | 2.00-3.00 ප. ව. | geomatletters@gmail.com |

ඒ අනුව විශ්වවිද්‍යාල නේවාසිකාගාර පහසුකම් හිමි සිසුසිසුවියන් ඉහත වගුවේ දක්වා ඇති දිනයන්හි දී පෙ.ව. 8.00 සිට ප.ව. 2.00 දක්වා කාලය තුළ නේවාසිකාගාර සඳහා අනුයුක්ත කිරීමට කටයුතු යොදා ඇත. ඔබගේ තාවකාලික නේවාසිකාගාරය විශ්වවිද්‍යාලයීය ප්‍රධාන පිවිසුම්වල එදින ප්‍රදර්ශනය කරනු ඇත. (පිරිමි- සිංහරාජ පිවිසුම/ ගැහැණු- ප්‍රධාන ගේට්ටුව)

කොවිඩ් 19 වසංගතය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් මහාචාර්ය දයානන්ද සෝමසුන්දර ශ්‍රවණාගාරයේදී පැවැත්වෙන අතර ඉහතින් දක්වා ඇති දිනයන් සහ වේලාවන්ට අනුව අදාළ පීඨ වල සිසුන් එම වැඩසටහනට සහභාගී විය යුතුය.

**ඔබ විශ්වවිද්‍යාලයට පැමිණීමට පෙර ඔබ ප්‍රදේශයට අයත් මහජන සෞඛ්‍ය නිලධාරී කාර්යාලයෙන්/ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයෙන් ඔබ නිරෝධායනය වූ/නොවූ පුද්ගලයෙක් බවට සනාථ කරනා සහතිකය ලබා ගැනීම අනිවාර්ය වේ. ඔබ පැමිණි පසු මුල් ලේඛනය පිවිසුම් දොරටුවලදී එකතු කරනු ලබන අතර පිටපතක් ඔබ ළඟ තබා ගත යුතුය.**

එම සහතිකයේ පිටපතක් **2020.08.07** දින හෝ ඊට පෙර එක් එක් පීඨයන්ට අදාළව ඉහතින් දක්වා ඇති විද්‍යුත් ලිපිනයන්ට එවිය යුතුය. එසේ එවීමේ දී එහි මාතෘකාව ලෙස ඔබගේ ලියාපදිංචි අංකය සඳහන් කළයුතුය.

ඔබ විශ්වවිද්‍යාලයට පැමිණීමේ දී හා රැඳීසිටීමේ දී අනුගමනය කළයුතු පොදු උපදෙස් මාලාවක් මේ සමග අමුණා ඇති අතර එයට අනුගත වීම අනිවාර්ය වේ. තවද විශ්වවිද්‍යාල ආපනශාලා මගින්ආහාර ලබා ගන්නේ නම් ඔබට පමණක් වෙන් වූ පිගානක්, කෝප්පයක් හා වතුර බෝතලයක්ගෙන ඒම නිර්දේශ කරන අතරම කොවිඩ්-19 වෛරසයෙන් ආරක්ෂා වීම උදෙසා නිසි සනීපාරක්ෂක පිළිවෙත් සැමවිටකම අනුගමනය කරනලෙසද තවදුරටත් දැනුම් දෙමි.

විශ්වවිද්‍යාල නේවාසික පහසුකම් හිමිවන්නේ නේවාසිකාගාර පහසුකම් හිමිව තිබූ සිසුසිසුවියන්ට පමණි. එමෙන්ම තමන් හැර වෙනත් කිසිවෙක් නේවාසිකාගාර තුලට ගෙන ඒම සම්පූර්ණයෙන්ම තහනම් වේ.

මෙම ආරක්ෂිත උපදෙස් ඔබ වෙත නිකුත් කරන්නේ ඔබ ඇතුළු සියලු ප්‍රජාවගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා වන බවද සඳහන් කරමි.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී / අධ්‍යයන හා ශිෂ්‍ය සේවා
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
ලේඛකාධිකාරී වෙනුවට

General Phone +94 045 2280014 Fax +94 045 2280015
+94 045 2280087
+94 045 2280178
Vice Chancellor Phone +94 045 2280012 Fax +94 045 2280128 E mail vc@sab.ac.lk
Registrar Phone +94 045 2280277 Fax +94 045 2280015 E mail registrar@sab.ac.lk
Bursar Phone +94 045 2280024 Fax +94 045 2280229

sab.ac.lk